**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ජනමාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව - 2017**

**DJ 02 - භාෂාව හා සන්නිවේදනය**

**ප්‍රශ්න අංක 01 සහ 08 ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. දෙවන කොටසේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ම ලකුණු කොට පිළිතුරු පත්‍රයට අමුණා භාරදෙන්න.**

**කාලය පැය තුනයි**

---

01. (අ) පහත දැක්වෙන යෙදුම්වල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. බ්‍රහ්ම මුහුර්ථය
ii. විශ්වසනීය ගණුදෙනු
iii. විශිෂ්ඨ ප්‍රතිඵල
iv. ධනේශ්වර ප්‍රථිපත්ති
v. වෘතාන්ත නිර්මාණය
vi. ළසෝ ගිනි දැල්
vii. ඥාන ගවේශනය
viii. පෞරාණික නටඹුන්

(ආ) පහත දැක්වෙන පද විසන්ධි කොට ලියන්න.

i. නීත්‍යනුකූල
ii. ව්‍යංග්‍යාර්ථය
iii. අත්‍යුත්කර්ෂය
iv. මහෞෂධ

(ඇ) පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කොට ලියන්න.

i. ස්වාමියාගේ මරණින් පසු සමිතියේ සභාපතිකම ගුණසේකර මහත්මියට හිමි වූවා ය.
ii. ශිෂ්‍යයන් තුන්දෙනෙකු විභාගයෙන් අසමත් විය.
iii. ගම්වාසීන් විසින් මා සෙනෙහසින් පිළිගන්නා ලදී.
iv. පිතිකරුවා පන්දුවට වේගවත් පහරක් එල්ල කරනු ලැබුවේය.

*(අනෙක් පිටුවට)*

(ඇ) පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. ප්‍රේක්ෂකයෝ මා බෙහෙවින් අගය කළහ.
ii. අපි තුන්දෙනෙක් ඔබට භාෂාව ඉගැන්වීමු.
iii. ගුරුළුගෝමීහු අමාවතුර රචනා කළහ.
iv. ශිෂ්‍යයෝ කලා උලෙළක් සංවිධානය කළහ.

(ඉ) පහත දැක්වෙන යෙදුම්වල සරල අදහස ලියන්න.

i. අසාධු ලේඛනය
ii. අනුවර්තනය
iii. ආත්මානුකම්පාව
iv. අසාධ්‍ය රෝග
v. සාර්වභෞමික
vi. පුනරාගමනය
vii. කාරණාකාරණ
viii. ව්‍යුත්පත්තිය

02. භාෂාව සම්මුතික වූ වාක් සංකේත පද්ධතියක් ලෙස හැඳින්වීමට හේතුව පැහැදිලි කොට මානව භාෂාවේ ස්වලක්ෂණ විවරණය කරන්න.

03. 'මානව භාෂාවේ කාර්යභාරය විඥාපන සන්නිවේදනය ඉක්මවා ගිය පෘථුල සංකීර්ණ තලයක විහිදී තිබේ.' සාකච්ඡා කරන්න.

04. මානව භාෂාවේ අර්ථ උත්පාදනයට අදාළ ව වාච්‍යාර්ථ හා ව්‍යංග්‍යාර්ථ හඳුන්වා දී සාහිත්‍ය නිර්මාණ කාර්යයෙහිලා ව්‍යංග්‍යාර්ථවල උපයෝගිතාව නිදර්ශන සහිත ව පෙන්වා දෙන්න.

05. "මානව භාෂාවේ නිර්මාණාත්මක භාවිතය කාව්‍යය මගින් වඩාත් ප්‍රබල ව ප්‍රතිබිම්බනය වෙයි." යෝග්‍ය උදාහරණ සහිත ව විග්‍රහ කරන්න.



*(අනෙක් පිටුවට)*

06. "ශාස්ත්‍රීය හා විඥාපන මූලික ලේඛනයේදී මෙන් ම නිර්මාණාත්මක ලේඛනයේදී ද නිරවද්‍ය භාෂා භාවිතය කෙරෙහි ලේඛකයා සාවධාන විය යුතු ය." විචාරාත්මක ව විමසන්න.

07. "මෙරට ඇතැම් විද්‍යුත් මාධ්‍යවල නිවේදක නිවේදිකාවන් අනවශ්‍ය ලෙස ඉංග්‍රීසි වචන මිශ්‍ර කරමින් වැඩසටහන් ඉදිරිපත් කිරීමෙන් භාෂාවේ ශිෂ්ට සම්ප්‍රදාය බිඳ වැටෙයි." අදහස් දක්වන්න.



(අනෙක් පිටුවට)

## දෙවන කොටස

**මේ කොටසේ නිවැරදි පිළිතුරු මෙහි ම සඳහන් කොට පිළිතුරු පත්‍රයට අමුණන්න.**

(අ) සිදත් සඟරා හෝඩියෙහි අක්ෂර සංඛ්‍යාව

i. 32
ii. 30
iii. 54
iv. 60

(ආ) මෙහි ඇති ස්වරය තෝරන්න.

i. ඥ
ii. ඍ
iii. ඣ
iv. ඤ

(ඇ) පහත සඳහන් පදවල ගැටපිල්ල යොදා ඇති වචනය තෝරන්න.

i. සෞඛ්‍යය
ii. කෘතඥතාව
iii. ප්‍රදර්ශනය
iv. ඓශ්වර්යය

(ඈ) අක්ෂර වින්‍යාසය නිවැරදි ව යොදා ඇති පද පේළිය තෝරන්න.

i. ළපලු, ළහිරු, ළදළු, ළපටි
ii. සෞභාග්‍යවත්, ආශ්වර්යවත්, වීර්යවත්, දැනුවත්
iii. ඇවිළෙනසුළු, පන්සිළු, සමුළු, බැටළු
iv. හදාරණ, සැරිසරන, සමරන, වදාරන



(අනෙක් පිටුවට)

(ඉ) නිවැරදි වාක්‍යය තෝරන්න.

i. පරිත්‍යාගශීලී මිනිසුන් ලෝකය තවත් ලස්සන කරයි.
ii. පරිත්‍යාගශීලී මිනිස්සු ලෝකය තවත් ලස්සන කරයි.
iii. පරිත්‍යාගශීලී මිනිස්සු ලෝකය තවත් ලස්සන කරති.
iv. පරිත්‍යාගශීලී මිනිසුන් ලෝකය තවත් ලස්සන කරති.

(ඊ) නිස්සරණධ්‍යාශය යන වචනය විසන්ධි වන්නේ

i. නිස්සරණ + අධ්‍යාශය
ii. නිස්සරණා + අධ්‍යාශය
iii. නිස්සරණා + ආධ්‍යාශය
iv. නිස්සරණ + ආධ්‍යාශය

(උ) 'වස්සා පුලුස්සා' නම් වූ තිරුලිපි එකතුව රචනා කළේ

i. කරුණාදාස සූරියආරච්චි
ii. දයාසේන ගුණසිංහ
iii. සුන්දර නිහතමානි ද මැල්
iv. ඩී. එෆ්. කාරියකරවන

(ඌ) මානව භාෂාවේ ස්වලක්ෂණයක් වන්නේ

i. ඖචිත්‍යය
ii. නිරවද්‍යතාව
iii. ද්විත්වතාව
iv. පවිත්‍රතාව



(අනෙක් පිටුවට)

(එ) ධ්වනිවාදී විචාරකයන්ගේ විග්‍රහයෙහි ඇතුළත් වන භාෂාව මගින් ජනනය වන අර්ථ ප්‍රකාර තුන වන්නේ

i. ප්‍රමුඛාර්ථ, අනියමාර්ථ, ගූඪාර්ථ
ii. වාච්‍යාර්ථ, ලක්ෂ්‍යාර්ථ, ව්‍යංග්‍යාර්ථ
iii. සංකේතාර්ථ, සංඥාර්ථ, සංදිග්ධාර්ථ
iv. පරමාර්ථ, අභීෂ්ටාර්ථ හා උත්කෘෂ්ටාර්ථ

(ඒ) 'වාක් සංකේතය හා එමගින් ප්‍රකාශිත අර්ථය අතර තාර්කික සම්බන්ධතාවක් ඇත.' මේ කියමන

i. සාවද්‍යය
ii. නිරවද්‍යය
iii. අසම්පූර්ණය
iv. සංකීර්ණය